## සුභසාධන ප්‍රතිලාභ

1. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය යටතේ නොමිලේ ලබා දෙන රක්ෂණයෙන් විගමණික සේවකයන්ට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට ලැබෙන ප්‍රතිලාභ

| අංක | සිදුවීම | ප්‍රතිලාභ |
|---|---|---|
| 01 | ගිවිසුම්ගත කාලය තුල විදේශ සේවයේ නියුක්තව සිටියදී ජීවිතක්ෂයට පත් වීම. | • රු.500,000.00 දක්වා |
| 02 | ගිවිසුම්ගත සේවා කාලය තුල විදේශ සේවයේ නියුක්තව සිටියදී මුහුණ දීමට සිදු වූ හදිසි අනතුරක් හේතුවෙන් හෝ බරපතල රෝගී තත්වයක් හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණ මාස 03ක් ගත වීමට පෙර ජීවිතක්ෂයට පත් වීම. | • රු.250,000.00 |
| 03 | ගිවිසුම්ගත සේවා කාලය තුල විදෙස් සේවයේ නියුක්තව සිටියදී මුහුණදීමට සිදු වූ හදිසි අනතුරක් හේතුකොටගෙන පූර්ණ ආබාධිත තත්වයට පත් වීම.<br>**3.1** සිදු වූ ආබාධිත තත්වය අනුව වන්දි ලබා දීම (ආබාධිත තත්වයන් ආවරණය කිරීමේ ප්‍රතිශතය ඇමුණුම- 2හි දක්වා ඇත) | • උපරිමය රු.400,000.00 දක්වා<br>(ගෙවීම් සිදු කිරීම වෛද්‍ය පරීක්ෂණයකින් අනතුරුව කරනු ලැබේ) |
| | **3.2** ආබාධිත විගමණික සේවකයා මෙරටට ගෙන්වා ගැනීම සඳහා වන ගුවන් ටිකට්පත් ගාස්තුව | • බදු ඇතුලත්ව සාමාන්‍ය පන්තියේ ගුවන් ටිකට්පත් ගාස්තුව<br>එසේ වුවද වෛද්‍ය නියමයන් මත ලෙඩුන්ගෙනයන ඇඳක ව්‍යාපාරික පන්තියේ ගුවන් ටිකට්පතක ගාස්තුව |
| | **3.3** ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව දැරීමට සිදු වන වෛද්‍ය වියදම් | • පෞද්ගලික රෝහලක රෝහල් ගත කිරීමකදී රු.50,000.00 ක උපරිමයකට යටත්ව ගෙවීම් කටයුතු සිදු කරනු ලබන අතර මෙරටට පැමිණ මාස 03ක් ගත වීමට පෙර බිල්පත් ඉදිරිපත් කල යුතුය.<br>• රාජ්‍ය රෝහලක රෝහල් ගත වීමකදී දිනකට රු.700.00 බැගින් උපරිමය දින 30ක් දක්වා ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ.<br>• ගාස්තු නොගෙවන රජයේ රෝහලක නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමේදී දැරීමට සිදු වන ඖෂධ වියදම්,රසායනාගාර පර්යේෂණ ගාස්තු,x-කිරණ ඡායාරූප හා ස්කෑන් සඳහා රු.29,000.00 ක් දක්වා ගෙවීම් සිදු කරනු ලැබේ.(බිල්පත් ඉදිරිපත් කල යුතුය) |
| 04 | ගිවිසුම්ගත සේවා කාලය තුල විදෙස් සේවයේ නියුක්තව සිටියදී අර්ධ අකර්මණ්‍ය තත්වයකට පත් වීම.<br>**4.1** සිදු වූ ආබාධිත තත්වය අනුව වන්දි ලබා දීම.(ආබාධිත තත්වයන් ආවරණය කිරීම් ප්‍රතිශතය ඇමුණුම -2 හි දක්වා ඇත) | උපරිමය රු.125,000.00 |
| | **4.2** ආබාධිත විගමණික සේවකයා මෙරටට ගෙන්වා ගැනිම සඳහා වන ගුවන් ටිකට්පත් ගාස්තුව | බදු ඇතුලත්ව සාමාන්‍ය පන්තියේ ගුවන් ටිකට්පත් සඳහා දැරීමට සිදු වන සත්‍ය වියදම<br>එසේ වුවද වෛදය නියමය මත ඔහු හෝ ඇය ව්‍යාපාරික පන්තියේ ටිකට්පත් සඳහා නිර්දේශ කරනු ලද්දේ නම් ඒ සඳහා දැරීමට සිදු වන වියදම |
| | **4.3** ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව දැරීමට සිදු වන වෛද්‍ය වියදම් | • පෞද්ගලික රෝහලක රෝහල් ගත කිරීමකදී රු.50,000.00 ක උපරිමයකට යටත්ව ගෙවීම් කටයුතු සිදුකරනු ලබන අතර මෙරටට පැමිණ මාස 03ක් ගත |

| | | |
|---|---|---|
| | | වීමට පෙර බිල්පත් ඉදිරිපත් කල යුතුය.<br>• රාජ්‍ය රෝහලක රෝහල් ගත වීමකදී දිනකට රු.700.00 බැගින් උපරිම දින 30ක් දක්වා ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ.<br>• ගාස්තු නොගෙවන රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීමේදී දැරීමට සිදු වන ඖෂධ වියදම්,රසායනාගාර පර්යේෂණ ගාස්තු, x-කිරණ ඡායාරූප හා ස්කෑන් සඳහා රු.29,000.00 ක් දක්වා ගෙවීම් සිදු කරනු ලැබේ.(බිල්පත් ඉදිරිපත් කල යුතුය) |
| 05 | ගිවිසුම්ගත සේවා කාලය තුල විදෙස් සේවයේ නියුක්තව සිටියදී මුහුණපෑමට සිදු වූ බරපතල රෝගී තත්වයන්,හදිසි අනතුරු,තුවාල වීම් හෝ ලෙඩ රෝග හේතුකොට නැවත පැමිණීම<br>**5.1** සිදු වූ ආබාධිත තත්වය අනුව වන්දි ලබා දීම.(ආබාධිත තත්වයන් ආවරණය කිරීම් ප්‍රතිශතය ඇමුණුම-2 හි දක්වා ඇත) | • බදු ඇතුලත් සාමාන්‍ය පන්තියේ ගුවන් ටිකට්පත් සඳහා දැරීමට සිදු වන සත්‍ය වියදම |
| | **5.2** විගමණික සේවකයින් මෙරටට පැමිණීමෙන් පසු දැරීමට සිදු වන වියදම් | • පෞද්ගලික රෝහලක රෝහල්ගත කිරීමකදී රු.50,000.00 ක උපරිමයකට යටත්ව ගෙවීම් කටයුතු සිදු කරනු ලබන අතර මෙරටට පැමිණ මාස 03ක් ගත වීමට පෙර බිල්පත් ඉදිරිපත් කල යුතුය.<br>• රාජ්‍ය රෝහලක රෝහල් ගත වීමකදී දිනකට රු.700.00 බැගින් උපරිම දින 30ක් දක්වා ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ.<br>• ගාස්තු නොගෙවන රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීමේදී දැරීමට සිදු වන ඖෂධ වියදම් ,රසායනාගාර පර්යේෂණ ගාස්තු, x- කිරණ ඡායාරූප හා ස්කෑන් සඳහා රු.29,000.00 ක් දක්වා ගෙවීම් සිදු කරනු ලැබේ.(බිල්පත් ඉදිරිපත් කල යුතුය) |
| 06 | ගිවිසුම්ගත සේවා කාලය තුල සේවා යෝජකයාගෙන් හෝ ඔහුගේ පවුලේ සාමාජිකයෙකුගෙන් සිදු වන ලිංගික අතවර හේතුවෙන් ගර්භනීභාවයට පත් වන විගමණික කාන්තාවන් නැවත ගෙන්වා ගැනීම.(සේවා යෝජක හැරගොස් සිටින කාන්තාවන් මේ සඳහා ඇතුලත් නොවේ)<br>**6.1** මෙරටට ගෙන්වා ගැනීමේදී දැරීමට සිදු වන ගුවන් ටිකට්පත් වියදම් | • බදු ඇතුලත්ව සාමාන්‍ය පන්තියේ ගුවන් ටිකට්පත් සඳහා දැරීමට සිදු වන සත්‍ය වියදම<br>එසේ වුවද වෛද්‍ය නියමය මත ඔහු හෝ ඇය ව්‍යාපාරික පන්තියේ ටිකට්පතක් සඳහා නිර්දේශ කරනු ලද්දේ නම් ඒ සඳහා දැරීමට සිදු වන වියදම |
| | **6.2** විගමණික සේවකයින් මෙරටට පැමිණීමෙන් පසු දැරීමට සිදු වන වියදම | • පෞද්ගලික රෝහලක රෝහල්ගත කිරීමකදී රු.50,000.00 ක උපරිමයකට යටත්ව ගෙවීම් කටයුතු සිදු කරනු ලබන අතර මෙරටට පැමිණ මාස 03ක් ගත වීමට පෙර බිල්පත් ඉදිරිපත් කල යුතුය.ඵ<br>• රාජ්‍ය රෝහලක රෝහල්ගත වීමකදි දිනකට රු.700.00 බැගින් උපරිම දින 30ක් දක්වා ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ.<br>• ගාස්තු නොගෙවන රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීමේදී දැරීමට සිදු වන ඖෂධ වියදම්,රසානාගාර පර්යේෂණ ගාස්තු, x-කිරණ |

| | | |
|---|---|---|
| | | ඡායාරූප හා ස්කෑන් පරීක්ෂණ යනාදිය සඳහා රු.29,000.00 ක් දක්වා ගෙවීම් සිදු කරනු ලැබේ.(බිල්පත් ඉදිරිපත් කල යුතුය) |
| 07 | යැපෙන්නන් සඳහා වන ප්‍රතිපාදන<br>7.1 රෝහල් ගත කිරීම් සඳහා ප්‍රතිපාදන ලබාදීම<br>(නීත්‍යානුකූල සහකරු/සහකාරිය සහ වයස අවු:25ට අඩු අවිවාහක හා රැකියා විරහිත දරුවන්) | • දිනකට රු.1000.00 බැගින් (උපරිමය දින 14ක්) |
| | 7.2 හදිසි ජීවිතක්ෂයට පත් වීම.<br>(නීත්‍යානුකූල සහකරු සහ වයස අවු:25ට අඩු අවිවාහක හා රැකියා විරහිත දූ දරුවන් - දෙදෙනකු සඳහා පමණි)<br>(මෙම ගෙවීම් උපරිම අවස්ථා දෙකක් සඳහා පමණක් සිදු කරයි) | • රු.10,000.00 ක් |

අවශ්‍ය ලිපිලේඛණ

වෛද්‍ය ප්‍රතිලාභ සඳහා

අසනීප/අනතුරු/කරදර/ වදහිංසා / ආබාධිත / පූර්ණාබාධිත තත්වයන් යටතේ වන්දි ඉල්ලුම් කිරීම

- ලංකාවට පැමිණ මාස 03 ක් අතුලත වන්දි සඳහා ඉල්ලුම් කිරීම අනිවාර්යය වේ.
- වන්දි ඉල්ලුම් පත්‍රය
- විදේශීය වෛද්‍ය සහතික
  දේශීය වෛද්‍ය සහතික (ලංකාවට පැමිණි දින සිට දින 07 ක් ඇතුළත ලබාගත්)
- සිදු වූ අනතුරක් මත ආබාධිත හෝ පූර්ණ ආබාධිත තත්වයන් සඳහා විශේෂඥ වෛද්‍ය වාර්ථාව (MER)
- දේශීය වෛද්‍ය බිල්පත්
- ගමන් බලපත්‍රයෙහි පිටපත් - ජීව දත්ත පිටුවෙහි (Bio Page) හා ආගමන විගමන තොරතුරු ඇතුළත් පිටුවල.
- පැමිණි ගුවන් ටිකට්පත / බෝඩින් කාඩ්පත(Boarding Card)
- වන්දි හිමිකරුගේ බැංකු ගිණුම් පොත හා තොරතුරු අඩංගු පිටුවෙහි පිටපතක්
- රක්ෂණ වන්දි ඉල්ලීම් ලිපිය ( ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කළමණාකරු සුභසාධන නමට ලියන ලද)

මරණයකදී

- දිවුරුම් ප්‍රකාශයක් (මියගිය අයගේ රක්ෂණ වන්දි සඳහා උරුමකරුවන් පිළිබඳව තොරතුරු ඇතුළත්) මෙම දිවුරුම් ප්‍රකාශය රු.50/- ක මුද්දරයක් මත අත්සන් කළ යුතු අතර දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ සාමදාන විනිසුරුවරයකු විසින් නිළ මුද්‍රාව තබා සහතික කර තිබිය යුතුය.)
- මිය ගිය පුද්ගලයාගේ ගමන්බලපත්‍රය, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, විවාහ වී ඇත්නම් විවාහ සහතිකය, මරණය පිළිබද විදේශීය වෛද්‍ය වාර්ථා, විදේශීය මරණ සහතිකය, තානාපති කාර්යාල වලින් නිකුත් කරන ලද ලියකියවිලි - එම සියළු ලේඛන වල මුල් පිටපත් හා ඡායා පිටපත් 02 බැගින්
- වන්දි ඉල්ලුම්කරු ඇතුළු සියළුම උරුමකරුවන්ගේ උප්පැන්න සහතික වල මුල් පිටපත්, බැංකු ගිණුම් පොත හා තොරතුරු අඩංගු පිටුවෙහි පිටපතක් (බද්ද ගිණුම් නොවිය යුතුය) වයස අවුරුදු 18 වැඩි නම් ජාතික හැඳුනුම්පත් හා එම සියළු ලේඛන වල ඡායා පිටපත් 01 බැගින්
- පවුලේ සාමාජිකයන්ගේ විස්තර ඇතුළත් වන පරිදි සකස් කරන ලද ග්‍රාම නිළධාරී වාර්තාවක්. එම වාර්තාව ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ යුතු අතර මිය ගිය අයගේ විවාහක/ අවිවාහක බව ග්‍රාම නිළධාරි සහතිකයේ සඳහන් කළ යුතුය.

- ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ - කොන්සියුලර් අංශය මඟින් නිකුත් කරන ලද මරණය පිළිබඳ විස්තර ඇතුලත් ලිපියේ මුල් පිටපත හා ඡායා පිටපතක් ( මෙම ලිපිය ඉල්ලුම් කළ යුතු වන්නේ මධ්‍යම ලේඛනාගාරයෙන් නිකුත් කරන ලද මරණ සහතිකය ලබාගෙන නැත්නම් පමණි)
- දේහය භාර ගැනීමේදී ඊට අදාළව රේගුව මඟින් ලබා දෙනු ලබන ලිපි ලේඛන හා ඒවායේ ඡායා පිටපත් 02 බැගින්

කොන්දේසි

a) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.ලියාපදිංචි කාලය රැකියා කොන්ත්‍රාත්තුව අනුව වසර 02 ක් හෝ 03 ක් බලපැවැත්වෙන අතර එය කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශගත වූ දින (ශ්‍රී ලංකාවෙන් පිටත් වූ දින) සිට බලපැවැත්වේ.

b) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය යටතේ ලබා දෙන රක්ෂණය මඟින් ආවරණය වන්නේ දේශීය වෛද්‍ය ප්‍රතිකාර (ශ්‍රී ලංකාවේ) සඳහා වන වියදම් පමණි.

c) අසනීප, කරදර, හිරිහැර, වධහිංසා හා අනතුරු

විගමණික සේවකයා ඉහත සඳහන් කරුණු හේතුවෙන් ලංකාවට ආපසු පැමිණ මාස 03 ක් ඉකුත්ව යාමට පෙර ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර අනෙකුත් අවශ්‍ය ලිපිලේඛණ සමඟ ළඟම පිහිටි විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යාලයකට හෝ ප්‍රධාන කාර්යාලයේ සුභසාධන අංශයට භාර දිය යුතුය.

d) විගමණික සේවකයා මරණයට පත් වීම

විගමණික සේවකයා සේවයේ යෙදී සිටියදී මරණයට පත් වූ විටක මරණය සිදු වී මාස 03 ක් ඉකුත් වීමට පෙර මරණකරුගේ ළඟම ඥාතියකු විසින් අදාළ ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර අනෙකුත් අවශ්‍ය ලිපිලේඛණ සමඟ ළඟම පිහිටි විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යාලයකට හෝ ප්‍රධාන කාර්යාලයේ සුභසාධන අංශයට භාර දිය යුතුය.

ගිවිසුම්ගත සේවා කාළය තුළ විදේශ සේවයේ නියුක්තව සිටියදී මුහුණ දීමට සිදු වූ හදිසි අනතුරක් හේතුවෙන් හෝ බරපතල රෝගී තත්වයක් හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණ මාස 03 ක් ගත වීමට පෙර මරණයට පත් වුවහොත් මරණයට පත් වූ දින සිට මාස 03 ක් ඇතුළත ළඟම ඥාතියා විසින් අදාළ ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර අනෙකුත් අවශ්‍ය ලිපිලේඛණ සමඟ ළඟම පිහිටි විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යාලයකට හෝ ප්‍රධාන කාර්යාලයේ සුභසාධන අංශයට භාර දිය යුතුය.

- රක්ෂණ ප්‍රතිලාභ හිමි නොවන අවස්ථා
  - සාවද්‍ය ලිපිලේඛණ ඉදිරිපත් කර ඇති අවස්ථා වල
  - අනාචාරයේ හැසිරීම නිසා ඇති වන මානව ප්‍රතිශක්තිකරණ ඌනතා රෝගය (HIV) හෝ ලිංගාශ්‍රිත රෝග
  - ශාරීරික දුබලතා හෝ රෝගී තත්වයක් සහිතව රැකියා සඳහා විදේශගත වීම් වලදී
  - ගුවන් ගමන් වාරයක් අතරතුරදී මරණයට පත් වීම හෝ අනතුරකට ලක් වීම. (ලංකාවෙන් පිටත් වීම සහ ලංකාවට පැමිණීමද ඇතුළත්ව)
  - රක්ෂිතයා දඬයමේ යාම, කඳුනැගීම් හා අනතුරුදායක ක්‍රීඩාවල නියැලීම. (Polo, Racing වැනි)
  - සේවය කරනු ලබන රටේ හෝ ආයතනයේ නීති රීති උල්ලංඝනය කරමින් සිදු කරන ලද ක්‍රියාවක් නිසා ඇතිවන මරණ හා අනතුරු
  - රටවල් අතර විදේශ සබඳතා අත්හිටවනු ලබන අවස්ථාවලදී
  - රැකියාවෙහි නියුතු රටෙහි ඇතිවන සිවිල් යුධ තත්ව, සතුරු ආක්‍රමණ, විදේශීය ආක්‍රමණ, විප්ලවයන්, කැරළි කෝලාහල, හමුදා පාලන වැනි තත්වයන් වලදී
  - සියදිවි නසා ගැනීම්, මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඇති වන මරණ, ලෙඩ රෝග හා අනතුරු
  - මානසික රෝග, මානසික කම්පන හා උමතු වීම්

- ○ සාමාන්‍ය දරු උපත් හා ගර්භනී තත්ව
- ○ භූමිකම්පා, ගිනිකඳු පිපිරීම්, සුනාමි හා ජල ගැලීම්
- ○ වෙනත් රක්ෂණාවරණයකින් ආවරණය වන අවස්ථා වලදී
- ○ රක්ෂිතයා වයස අවුරුදු 65 ට වැඩි වීම හා වයස අවුරුදු 18 ට අඩු වීම
- ○ වැඩ වර්ජන හා කැරළි වලට සහභාගී වීම
- ○ ඇස් පරීක්ෂා කිරීම්, ඇස් කණ්ණාඩි, කාච, දන්ත ප්‍රතිකාර, ශ්‍රවණ උපකරණ ආදියට වන වියදම්
- ○ රෝහල් වල විශේෂ ඉල්ලීම් මත ලබා දෙන රූපවාහිනී, දුරකථන, ගුවන් විදුලි වැනි සේවාවන් හා අමතර ආහාර ලබා ගැනීම් සඳහා වන වියදම්
- ○ උපතින්ම ලද රෝගී තත්වයන් හෝ අස්වාභාවික තත්වයන්
- ○ ප්ලාස්ටික් සැත්කම් හා රූපලාවන්‍ය සැත්කම් සිදුකර ගැනීමේදී ඇති වන අනතුරු
- ○ තමා විසින් නිත්‍ය පිළිවෙළට කරනු ලබන වෛද්‍ය පරීක්ෂණ, වෛද්‍ය වාර්තා ලබා ගැනීම්
- ○ උපත්පාලන හා උපත්පාලන උපකරණ, ඖෂධ, දරුගැබ් හානි වීම්, ගබ්සා කිරීම්, අතුරු ආබාධ වැනි තත්වයන් වලදී
- ○ බාහිර රෝගී ප්‍රතිකාර හා කිරණ ප්‍රතිකාර ලබා ගැනීම් වලදී
- ○ විදේශීය වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන වියදම්

❖ අභ්‍යන්තර ප්‍රතිකාර සඳහා රක්ෂණය මඟින් ගෙවනු ලබන රු. 50,000.00 ඇතුළත පහත සඳහන් පරීක්ෂණ සඳහා වන වියදම් රෝහලකට ඇතුළත් නොවී පිළිගත් වෛද්‍යවරයකුගේ නිර්දේශය මත කරනු ලබන්නේ නම් එම වියදම් ප්‍රතිපූරණය කළ හැක.
(MRI, ENDOSCPY, BRONCHSCOPY, SIGMOIDOSCOPY, COLONSCPY, CT SCAN)

2.ශිෂ්‍යත්ව වැඩසටහන

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා විදේශ ගත වන විගමණික සේවකයින්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් දිරිමත් කිරීම සඳහා මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබයි.

- 5 වසර ශිෂ්‍යත්වය සමත් - රු. 15,000.00
- අ.පො.ස (සා/පෙළ) සමත් - රු. 20,000.00
- අ.පො.ස (උසස් පෙළ) සමත් - රු. 30,000.00
(විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරන සිසුන්)

අවශ්‍ය සුදුසුකම්

- ○ අදාළ විභාගයට ඉදිරිපත් වන දිනට පෙර වසර 05 ක් ඇතුළත මව/පියා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.
- ○ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වන දූ දරුවන් ඔවුන් පදිංචි වී සිටින දිස්ත්‍රික්කයෙහි ශිෂ්‍යත්ව කඩඉම් ලකුණු ලබා තිබිය යුතුය.
- ○ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය ගණිතය ඇතුළු විෂයන් 06 ක් සම්මාන සාමාර්ථ 03 ක් සහිතව එකවර සමත්ව උසස්පෙළ හදාරමින් සිටිය යුතුය.
- ○ අ.පො.ස උසස් පෙළ සමත් වී රජයේ විශ්ව විද්‍යාලයක පූර්ණ කාලීන අභ්‍යන්තර උපාධි පාඨමාලාව හදාරනු ලබන පළමු වසර සිසු සිසුවියක විය යුතුය.
- ○ සෑම වසරකම ජනවාරි මස මෙම ශිෂ්‍යත්ව පිළිබඳ පහත සඳහන් ආකාරයට ප්‍රසිද්ධ කරනු ලැබේ.
  - ප්‍රසිද්ධ පුවත්පත් (සිංහල හා දමිළ)
  - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වෙබ් අඩවිය (www.slbfe.lk)
  - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පළාත් කාර්යාල මඟින්

සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින්
සියළුම රජයේ පාසල් වල විදුහල්පති මඟින්
සියළුම රජයේ විශ්ව විද්‍යාල වල ලේඛකාධිකාරී මඟින්

- අයදුම්පත් භාර ගැනීම සෑම වසරකම නියම කරනු ලබන කාල සීමාව තුලදී පමණක් සිදු කරනු ලබයි. ( ජනවාරි සිට අප්‍රේල් දක්වා)

3.ආබාධිත විගමණික සේවකයින් සඳහා නිවාස ලබා දීම (සහන නිවාස වැඩසටහන)

- විදේශ රැකියාවන්හි නිරතව සිටියදී සිදු වන අනතුරක ප්‍රතිපලයක් ලෙස පූර්ණ ආබාධිත තත්වයට පත්වූ (විශේෂඥ වෛද්‍යවරයකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය වාර්තාවට අනුව 65% වැඩි ආබාධිත තත්වයකදී) නිවසක් නොමැති විගමණික සේවකයින් සඳහා රු. 500,000.00 ක උපරිමයකට යටත්ව නිවසක් තනා දීම මේ යටතේ සිදු කරනු ලබයි.
- නිවාස සැලසුම සහ ඇස්තමේන්තුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් සකසනු ලබයි.

ප්‍රතිලාභ ලබා ගැනීමේ සුදුසුකම්

a) කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවක් සඳහා පිටත්ව ගොස් තිබිය යුතුය.
b) අදාළ සිදුවීම ලියාපදිංචිය වලංගු කාල සීමාව තුළ විදේශ රැකියාවේ නියුක්තව සිටියදී සිදු වීම හා ඒ හේතුවෙන් රැකියාව අහිමිව ශ්‍රී ලංකාවට පැමිණ තිබිය යුතුය.
c) ආබාධිත විගමණික සේවකයාගේ නමට නිවසක් තැනීමට සුදුසු නීත්‍යානුකූල ඉඩමක් තිබිය යුතුය.

4.පාසල් උපකරණ ලබා දීම.

කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගත වන විගමණිකයින්ට සේවයෙහි නියුක්තව සිටියදී මුහුණ පෑමට සිදු වන කරදර හේතුවෙන් ආදායම අහිමිවීම මත ඔවුන්ගෙන් යැපෙන දූ දරුවන් හට ඉදිරි අධ්‍යාපනය කටයුතු කර ගැනීමට අපහසු තත්වයන් තුළ ඊට සහනයක් සැළසීම සඳහා පාසල් උපකරන ලබා දීම සිදු කරනු ලබයි.

මේ සඳහා එක් දරුවකු වෙනුවෙන් රු. 5,000.00 ක උපරිමයකට යටත්ව ඉගෙනීම සඳහා අවශ්‍ය උපකරණ කට්ටල ලබා දේ.

අවශ්‍ය සුදුසුකම්

a) භාරකරු විසින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා පාසල් උපකරණ ලබාදෙන ලෙස කළමණාකරු (සුභසාධන) වෙත ඉල්ලීම් කරන ලද ලිපියක්
b) දරුවන්ගේ උප්පැන්න සහතික වල සහතික කළ ඡායා පිටපත්
c) දරුවන් ඉගෙනුම ලබන පාසල් වල විදුහල්පතිගේ නිර්දේශය සහිත අවශ්‍ය උපකරණ ලැයිස්තුවක් (රු.5,000.00 උපරිමයකට යටත්ව)
d) සංවර්ධන නිළධාරිගේ නිර්දේශය සහිතව ක්ෂේත්‍ර පරික්ෂණ වාර්තාවක් (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සමඟ)
e) පවුලේ ආදායම් වාර්තාවක් (ග්‍රාම නිළධාරි නිර්දේශය සහිතව ප්‍රා. ලේකම්ගේ අනු අත්සන සමඟ)
f) මව/පියා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ ගතවූ බව තහවුරු කිරීමේ ලේඛණ (ගුවන් ගමන් බලපත්‍රයේ ඡායා පිටපතක්)

5..යැපෙන්නන් සඳහා සුභසාධන කටයුතු

a) කාර්යාංශයේ ලියාපදිංචිව විදේශ රැකියාවක නිරත දෙමාපියන්ගේ සුවිශේෂී (අධ්‍යාපනික/ක්‍රීඩා/ සෞන්දර්යය/ විෂය බාහිර ක්‍රියාකාරකම්) දක්ෂතා දක්වන අධ්‍යාපනය හදාරන දූ දරුවන් සඳහා ආධාර උපකාර කිරීම.
සුවිශේෂී දක්ෂතා සහිත එහෙත් ආර්ථික අපහසුතා හේතුවෙන් එම ඉලක්කයන් වෙත ළඟා වීමට නොහැකි කාර්යාංශයේ ලියාපදිංචිය සහිත විගමණික දෙමාපියන්ගේ දූ දරුවන් සඳහා ආධාර හෝ උපකාර ලබා දීම.
මේ සඳහා අධ්‍යාපනය ලබන ආයතනයෙන් සුවිශේෂී බව නිර්දේශ කර සුවිශේෂී තත්වයන් දක්වන අංශ හා අවශ්‍ය ආධාරය හෝ උපකාරය කුමක්ද යන්න සඳහන් කර ඉල්ලීම් ලිපියක් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් ඉදිරිපත් කළ යුතුය.

b) කාර්යාංශයේ ලියාපදිංචිය සහිතව විදේශ රැකියාවන්හි යෙදෙන දෙමාපියන්ගේ විශේෂ අවශ්‍යතා සහිත දූ දරුවන් (දෘෂ්‍යාබාධිත/ ශ්‍රවනාබාධිත/ ආබාධිත) සඳහා ආධාර හෝ උපකාර ලබා දීම.
අදාළ ග්‍රාම නිළධාරි/ සංවර්ධන නිළධාරි/ ප්‍රාදේශීය ලේකම් නිර්දේශ සහිතව හා ප්‍රධාන කාර්යාලයේ/ කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාල වල අධීක්ෂණය යටතේ එම දරුවන් සඳහා අවශ්‍ය ආධාර උපකාර මොනවාද යන්න පරීක්ෂා කර බලා වඩා ප්‍රතිඵලදායි ආධාර උපකාර මොනවාද යන්න තීරණය කර ලබා දීම

c) කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශ රැකියාවක නිරත වන නමුත් ආර්ථික අපහසුතා මධ්‍යයේ ජීවත්වන ළමුන් සඳහා ආධාර හෝ උපකාර ලබා දීම.
මේ යටතේ ඔවුන්ගේ අධ්‍යාපන, සෞඛ්‍ය හා සමාජ ආරක්ෂාව ඉහළ නැංවීමට අවශ්‍ය සහන සැලසීම.

මේ සඳහා ඉදිරිපත් වන ඉල්ලීම් සලකා බලා ඒ ඒ සිද්ධි අනුව ආධාර ලබා දීම පිළිබඳව තීරණය කිරීමේ බලය කාර්යාංශය සතු වේ. ඒ ඒ සිද්ධි අධ්‍යයනය කිරීම සඳහා ඉල්ලුම්කරුවන් වෙතින් ඊට අදාළ තහවුරු කිරීමේ ලිපිලේඛන ඉල්ලා සිටීමට කාර්යාංශයට බලය ඇති අතර ඒවා ලබා දීමට ඉල්ලුම්කරු බැඳී සිටී.

## 6.විගමණික සේවකයින් සඳහා ලබා දෙන අඩු පොළී ණය

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියා සඳහා යොමු වන විගමණික සේවකයින් හට ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව යන බැංකු මඟින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිර්දේශය මත පහත සඳහන් ණය ලබා දේ.

- පෙර විගමණික ණය

විදේශ රැකියාව සඳහා පිටත්වීමට අවශ්‍ය මූලික වියදම් වන ගුවන් ටිකට්පත් ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ ගාස්තු, කාර්යාංශයේ ලියාපදිංචි ගාස්තුව හා වෙනත් වියදම් පියවා ගැනීම සඳහා පෙර විගමණික ණය ලබා දේ.

අවශ්‍ය සුදුසුකම්

a) ප්‍රථම වතාවට විදේශගත වන අයකු වීම (ගෘහ සේවිකාවන් සඳහා මෙම ණය මුදල ලබා නොදේ)
b) එතෙරදී ලබන වැටුප රු. 40,000.00 ට වඩා අඩු වීම
c) වයස අවුරුදු 55 ට අඩු වීම.

අවශ්‍ය ලියකියවිලි

a) විදේශ ගමන් බලපත්‍රය
b) විසා හෝ රැකියා බලපත්‍රය
c) ග්‍රාම නිළධාරි වාර්තාව (පදිංචිය සනාථ කිරීමට)
d) රැකියා ගිවිසුම
e) විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් නිකුත් කරන පුහුණු සහතිකය

○ විදේශ රැකියා නියෝජිතායනයක් මඟින් විදේශ රැකියා සඳහා විදේශගත වන්නේ නම් ඉහත ලියකියවිලි වලට අමතරව පහත ලියකියවිලිද අවශ්‍යය.

f) ණය ලබා දෙන ලෙස ඉල්ලා ණය ලබා ගැනීම පිළිබඳ සියළු විස්තර ඇතුළත් විදේශ රැකියා නියෝජිතායතනය මඟින් නිකුත් කළ ලිපිය
g) මුල් අනුමැති ලිපිය
h) ඒජන්සි ආයතනය විසින් අදාළ බැංකුව වෙත නිකුත් කරනු ලබන බැංකු තැන්පතු පත්‍රිකා

- නිවාස ණය

නිවාස ණය ලබා දෙන්නේ නිවසක්/ ඉඩමක් මිලදී ගැනිමට/ නිවසක් ඉදිකර ගැනීමට/ නිවසට කොටසක් එකතු කිරීමට හෝ නිවස අළුත්වැඩියා කිරීමට යන නිවාස අවශ්‍යතා සඳහා වේ. ඉහත බැංකු තුනට අමතරව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින්ද ඉහත සඳහන් නිවාස කටයුතු වෙනුවෙන් නිවාස ණය ලබා දේ.

අවශ්‍ය සුදුසුකම්

a) ලංකා බැංකුව/ මහජන බැංකුව/ජාතික ඉතිරිකිරීමේ බැංකුව යන බැංකු වල වසරක් පුරා පවත්වාගෙන යන NRFC ගිණුමක් තිබීම හා එහි ශේෂය ඩොලර් 500 ක් තිබීම
b) අදාළ දේපළෙහි ඔප්පු තිබීම
c) වයස අවුරුදු 55 ට අඩු වීම
d) NRFC නොමැති නම් ලංකාවේ ඕනෑම බැංකුවක ඇති ඉතිරි කිරිමේ ගිණුමක රු. 25,000.00 බැගින් ශේෂයක් මාස 06 ක් පවත්වාගෙන යාම (රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සඳහා පමණි)

අවශ්‍ය ලියකියවිලි

a) ගමන් බලපත්‍ර පිටපත
b) NRFC ගිණුම් ප්‍රකාශනය හෝ ඉතිරි කිරීමේ ගිණුම් පොත
c) ඇටෝර්නි බලපත්‍රය හෝ දිවුරුම් ප්‍රකාශයක්
d) ඇටෝර්නි බලපත්‍රයේ ඥාතිත්වය තහවුරු කිරීමට විවාහ සහතිකය හෝ උප්පැන්න සහතිකය
e) ණය ලබා දීම සඳහා කළමණාකරු සුභසාධන වෙත කළ ඉල්ලීම් ලිපිය

- ස්වයං රැකියා ණය

කාර්යාංශයේ ලියාපදිංචිය ලබා ඇති විගමණික සේවකයන් සඳහා ලබා දෙන ණය යෝජනා ක්‍රමය

| මූල්‍ය ආයතනය | ණය වර්ගය | ණය මුදල |
|---|---|---|

| | | |
|---|---|---|
| මහජන බැංකුව | පෙර විගමණික ණය | 50,000.00 |
| | නිවාස ණය | 250,000.00 |
| | ස්වයංරැකියා ණය | 250,000.00 |
| ලංකා බැංකුව | පෙර විගමණික ණය | 50,000.00 |
| | නිවාස ණය | 300,000.00 |
| | ස්වයංරැකියා ණය | 300,000.00 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | පෙර විගමණික ණය | 50,000.00 |
| | නිවාස ණය | 300,000.00 |
| | ස්වයංරැකියා ණය | - |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | නිවාස ණය | 500,000.00 |

**7.වෛද්‍ය කඳවුරු පැවැත්වීම.**

**කායික, අක්ෂි හා දන්ත වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය කඳවුරු පවත්වනු ලබන අතර නිශ්චය කර ගන්නා රෝගී තත්වයන් සඳහා ප්‍රතිකාර ලබා දීමද සිදු කරනු ලබයි.**

2. **රෝහල්ගත රෝගීන් පිළිබඳව සොයා බැලීම හා වෛද්‍ය උපදෙස් මත අවශ්‍ය ඖෂධ හා අනෙකුත් දේවල් ලබා දීම.**

**රෝහල්වල නේවාසිකව ප්‍රතිකාර ලබන විගමණික සේවකයන් පිළිබඳව සොය බැලීම හා වෛද්‍යවරුන්ගේ නිර්දේශය මත අවශ්‍ය ඖෂධ හා අනිකුත් දෑ ලබා දීම.**

3. **විගමණික සේවකයින් සඳහා ලබා දෙන විශේෂ සුභසාධන සේවා**

**විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ආවරණය නොවන අවස්ථා වලදී ඉතාමත් සාධාරණ හේතු සලකා බලා මානුෂීය පදනම මත සහන සැලසීම.**